**කහවත්ත ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 18 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විමධ්‍යගත ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල කර්මාන්ත 05 කට අදාල පරිපාලන වියදම් වශයෙන් ලද එකතුව රු. 89,788 ක් මූලධන ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් මෙහෙයුම් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව රේඛීය අමාත්‍යාංශයෙන්, සබරගමුව පළාත් සභාවෙන් හා කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු පරිපාලන වියදම් එකතුව රු. 204,393 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු එකතුව රු. 283,061 ක් වූ වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**
**------------------------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 97,435,042 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.3 අනුකූල නොවීම්**

**--------------------**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**--------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | ---------------------------------------- | ------------ | ------------------- |
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | 204 වන රීතිය | - | භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් ඌනතා ලෙස පෙන්වා දී තිබූ වේදිකාවේ කොටස්, සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | (i) මුදල් රෙගුලාසි 104 හා 105 | 115,443 | ඉකුත් වර්ෂයේදී සිදුවී තිබුණු වාහන අනතුරකට අදාළව රක්ෂණාවරණය මඟින් ප්‍රතිපූරණය කර නොතිබූ අලාභය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 110 | | හානි පාඩු පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 371 | 153,142 | 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල ලබා දී තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව සතු වාහන 08 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2017 පෙබරවාරි 08 දිනැති අංක 02/2017 දරන සබරගමු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් චක්‍රලේඛය | 697,315 | සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 04 කදී පළාත් සභාවේ හා ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් පමණක් මිලගණන් කැඳවා භාණ්ඩ මිලදීගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,817,312 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,927,310 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,371,486 | 3,480,614 | 4,095,870 | 1,633,246 | 3,258,263 | 3,413,341 | 4,304,651 | 2,273,847 |
| කුලී | 8,003,826 | 5,552,976 | 5,521,526 | 686,519 | 6,978,800 | 4,506,216 | 4,518,517 | 599,969 |
| බලපත්‍ර ගාස්තු | 475,130 | 919,367 | 925,867 | - | 314,000 | 321,603 | 327,723 | - |
| වෙනත් ආදායම් | 8,853,754 | 9,621,437 | 5,569,757 | 15,071,950 | 8,704,500 | 8,878,606 | 4,819,699 | 11,372,458 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු හා වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 21, සියයට 95 හා සියයට 10 කින් වැඩි වී තිබූ අතර බදුකුලී ආදායම, සේවා සඳහා ගාස්තු, වෙනත් ආදායම් හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 31, සියයට 17, සියයට 86 හා සියයට 59 කින් අඩුවී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**-----------------**

**(අ) වරිපනම්**

**---------**

2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් ශේෂය රු. 1,468,697 ක් වූ අතර, එම ශේෂය තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 101 කට අදාලව එකතුව රු. 529,635 ක හිඟ ශේෂයක් පැවතුණි. හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

**(ආ) අක්කර බදු**

**-------------**

2017 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු එකතුව රු. 128,111 ක් වූ හිඟ අක්කර බදු අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

**-----------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර අළුත් කලයුතු කර්මාන්ත 05 ක් බලපත්‍ර අළුත් නොකිරීම හේතුවෙන් රු. 20,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබූ අතර එම කර්මාන්ත පවත්වාගෙන යාමේදී සිදුවී ඇති පාරිසරික බලපෑම් පිළිබඳ කාලීන ඇගයීමක් සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී සිදුකර තිබූ සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලද ව්‍යාපාර ඒකක 19 ක් පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණ ද සභාව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු. 4,857,250 ක් වූ උසාවි දඩ ආදායම අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු. 263,150 ක හිඟ මුද්දර බදු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු මුද්දර බදු ආදායම හඳුනාගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යසාධනය**

**-----------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් කසළ බැහැර කරනු ලබන අක්කර 03 ක් පමණ වූ භූමිය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ii) සභාව විසින් රැස්කරන දිරන කසළ වලවල් කපා බැහැර කිරීම සිදුකරමින් පැවතුණු අතර, විධිමත් කසළ කළමනාකරණ වැඩපිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

**---------------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබූ හා වෙන්දේසි කල යුතු බවට නිර්දේශිත කැබ් රථයක් හා ට්‍රේලරයක් 2018 මැයි වනවිටත් සභා භූමිය තුල අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

(ආ) සුදුසු පරිදි අළුත්වැඩියා කිරීමෙන්, දීර්ඝ කාලයක් ප්‍රයෝජනයට ගත හැකි බවට ගොඩකවෙල ඩිපෝ ඉංජිනේරු විසින් නිර්දේශ කර තිබූ රු. 1,300,000 ක් වටිනා ඩබල් ඩ්‍රම් වෛබ්‍රේටර් රෝල 2013 වර්ෂයේ සිට අළුත්වැඩියා කිරීමකින් තොරව සභා භූමියේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් මස අනතුරකට ලක්ව අළුත්වැඩියා කටයුතු සඳහා යොමුකර තිබූ ට්‍රැක්ටරයක් 2018 මැයි වනවිටත් අළුත්වැඩියා කිරීමකින් තොරව අදාල ගරාජයේ අනාරක්ෂිතව ගාල්කර තිබුණි.

**3.3 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එක් වැය විෂයයක් සඳහා සලසා දී තිබූ රු. 82,078 ක ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු. 23,536 ක් වැය කර තිබුණි.

(ආ) වැය විෂයයන් 35 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 3,866,346 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී පැවතුණි.

(ඇ) වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 6,637,619 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් සභාව සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් හඳුනා නොගැනීම |
| | | (iii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | වත්කම් උපයෝජනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඈ) | අයවැය පාලනය | (i) | ප්‍රතිපාදන ඉතිරිවීම් පැවතීම |
| | | (ii) | ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබීම |